# ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය
# ஸ்ரீ லங்கா நிருவாக சேவைச் சங்கம்
# SRI LANKA ADMINISTRATIVE SERVICE ASSOCIATION


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | SASA/2022/A/30 | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.10.10 |

**සියලුම සාමාජිකයන් වෙත,**

**සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ සැරිසරන සමහර කරුණු සම්බන්ධයෙන් සාමාජිකයින් අතර විවිධාකාරයෙන් මත ප්‍රකාශනය වන බව නිරීක්ෂණය විය. විශේෂයෙන්ම දේශපාලන පක්ෂ සහ සිවිල් සංවිධාන සමග පැවති සාකච්ඡා සම්බන්ධයෙන් මෙන්ම රාජ්‍ය පරිපාලන ලේකම්වරයා විසින් "රජයේ නිලධාරීන් විසින් සමාජ මාධ්‍ය ජාල වෙත අදහස් ප්‍රකාශ කිරීම" මැයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛය සම්බන්ධ කරුණු මතභේදයන්ට තුඩු දුන් බව අපි නිරීක්ෂණය කළෙමු.**
**2022.04.03 වන දින සිට ඇති වූ සමාජ ,ආර්ථික හා දේශපාලන කැළඹීම් හමුවේ රටේ ස්ථාවරත්වය, පරිපාලනය නිසි පරිදි පවත්වාගෙන යමින් ඇති වූ තත්ත්වය තුළින් රට නිවැරදි දිශානතියකට යොමු කිරීම අරමුණු කරගනිමින් ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය ලෙස විවිධ ක්‍රියාමාර්ගයන් අනුගමනය කළෙමු. විශේෂයෙන් ම දේශපාලන හා ආර්ථික ස්ථාවරභාවය පවත්වාගෙන යාම සඳහා විධායක සභාවේ හා විධායක සභාවෙන් බැහැර අන් සාමාජිකත්වය ද එයිනුත් ඔබ්බට ගොස් විවිධ ක්ෂේත්‍ර නියෝජනය කළ සිවිල් සමාජ ක්‍රියාකාරීන් හා වෘත්තීය සංගම් සමග නිරන්තර සම්බන්ධතා ඇති කර ගනිමින් අපගේ මතවාදය පිළිබඳව ලිඛිතව ද සාකච්ඡා හා සම්මන්ත්‍රණ මගින් ද මහජනතාව වෙත හා එම ක්‍රියාකාරකම් ක්‍රියාවෙහි යෙදවීමෙහි ලා වගකිව යුතු දේශපාන පක්ෂ ද දැනුම්වත් කිරීමට කටයුතු කළෙමු. එහිදී, කිසිදු දේශපාලන පක්ෂයකට පක්ෂග්‍රාහි නොවීමටද,එකී දේශපාලන පක්ෂවල මතවාදයන් සංගමයේ ක්‍රියාකාරීත්වය කෙරෙහි බලපෑමක් එල්ල නොවන ආකාරයට කටයුතු කිරීමට ද වගබලා ගනු ලැබූ බවද මෙහිදී විශේෂයෙන් ම පැහැදිලි කළ යුතු ය. ඒ අනුව අප පහත සඳහන් දේශපාලන පක්ෂ,පුද්ගලයන් හා සිවිල් සංවිධාන සමග සාකච්ඡා පවත්වන ලදී.**

- ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ ගරු කථානායක තුමා
- රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යතුමා(වත්මන් අගමැතිවරයා )
- මහ බැංකු අධිපතිවරයා
- එවකට මුදල් අමාත්‍ය අලි සබ්‍රි මහතා
- එක්සත් ජාතික පක්ෂය(වත්මන් ජනාධිපතිවරයා විපක්ෂ මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කරන අවස්ථාවේ )
- ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
- සමගි ජනබල වේගය
- ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ
- ජනතා විමුක්ති පෙරමුණ
- ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය
- ආණ්ඩුපක්ෂයෙන් බිදී ස්වාධීන වූ කණ්ඩායම්වල පක්ෂ නායකයන්


**23 සී, සමුළු නිවාස, කැප්පෙටිපොල මාවත, කොළඹ 05. 23 சீ, சமிட் தொடர்மாடி,கெப்பிட்டிப்பொல மாவத்தை, கொழும்பு-05.**
**23C, Summit Flats, Keppetipola Mw., Colombo 05.**

**දුරකතනය/ தொலைபேசி/Telephone : 011 5766855** ෆැක්ස්/தொலைநகல்/ Fax : 011 2058027
**විද්‍යුත් තැපැල/மின்னஞ்சல்/ Email : sasa.execo@gmail.com** වෙබ් අඩවිය/இணையத்தளம்/ Web: www.sasa.lk

- 43 වන සේනාංකය
- පිවිතුරු හෙළ උරුමය
- බහුජන සංවිධාන එකමුතුව
- රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය
- ගණකාධිකාරි සේවා සංගමය
- ක්‍රමසම්පාදන සේවා සංගමය
- රජයේ විධායක නිලධාරීන්ගේ ඒකාබද්ධ කමිටුව
- මාර්තු 12 ව්‍යාපාරය
- ජාතික වෘත්තිය සමිති මධ්‍යස්ථානය
- අරගල භූමියේ සාමාජිකයන්

මෙම හමුවීම් තුළදී අපගේ අපේක්ෂාව වූයේ අප විසින් ඉදිරිපත් කරනු ලැබූ කෙටි කාලීන යෝජනාවලිය යථාර්ථයක් බවට පත් කරමින් එම යෝජනාවන් ක්‍රියාත්මක තලයට ගෙන ඒම සඳහා උපරිම බලපෑමක් සිදු කිරීමයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය සේවයේ දිශානතිය පිළිබඳව හරවත් සංවාදයක් කරා යොමුවීමට හැකි වූ අතර සෑම පාර්ශවයක්ම පාහේ එකී කරුණු සම්බන්ධයෙන් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තුළ සාධනීය ප්‍රතිචාර සමග කරුණු ඉදිරිපත් කරන ලදී.

මෙම සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් පිහිටුවීමට නියමිත ජාතික සභාව හමුවේ වෘත්තීය සංගම් හා සිවිල් සංවිධානවල අදහස්/ යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන ලෙසට අප සංගමය විසින් කරනු ලැබූ ඉල්ලීම ජාතික සභාවට යොමු කිරීමටත්, ජාතික ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම සඳහා වන යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට සහයෝගය ලබාදීමටත් එකී කණ්ඩායම් විශේෂයෙන්ම පාර්ලිමේන්තු නියෝජිතයන් විසින් එකඟතාව පල කරන ලදී . පවත්නා දේශපාලන, ආර්ථික හා සාමාජීය අස්තාවරත්වය ජනතා නියෝජිතයන්ගෙන් බැහැර වෙනත් ක්‍රියාමාර්ගයකින් විසඳිය නොහැකි බව ප්‍රායෝගික කරුණක් බැවින් පවත්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් එය විසඳා ගත යුතු බව අප සංගමයේ අදහසයි.

දේශපාලන බලපෑමෙන් තොර ස්වාධීන රාජ්‍ය සේවයක් සඳහා 22 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා වන යෝජනා දේශපාලන පක්ෂ හා කණ්ඩායම් වෙත ඉදිරිපත් කරනු ලැබූ අතර එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාජ්‍ය සේවය සම්බන්ධයෙන් වන කොටස් පාර්ලිමේන්තුවේ කාරක සභා අවස්ථාවේදී හෝ සංශෝධනයට ලක්කර කිරීම අපේක්ෂා කරනු ලැබීය.

"රජයේ නිලධාරීන් විසින් සමාජ මාධ්‍ය ජාල වෙත අදහස් ප්‍රකාශ කිරීම" මැයෙන් රාජ්‍ය පරිපාලන ලේකම්වරයා විසින් නිකුත් කර ඇති 14/2022 චක්‍ර ලේඛය සම්බන්ධව සංගමයේ සභාපති වරයා විසින් කරන ලදැයි පලවූ ජාතික පුවත්පතක පළවී තිබුණ ප්‍රවෘත්තිය සම්බන්ධව සෘණාත්මක අදහස් සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය විය. එහි දී අප දැරූ ස්ථාවරය වූයේ සමාජ මාධ්‍ය වාරණයෙන් මූලික අයිතියක් වන භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස සීමා කිරීම නොව රජයේ නිලධාරීන් සමාජ මාධ්‍ය ඔස්සේ අදහස් පළ කිරීමේ දී වගකීමකින් තොරව සහ ආයතනික සහ සදාචාරයට ගරු නොකරන අයුරින් මත පළ කිරීම සුදුසු නොවන බවය. එසේ ම ආයතන සංග්‍රහයේ සහ පවත්නා චක්‍රලේඛ විධිවිධාන පවතින බැවින් සීමා කිරීම් සිදු කිරීමට සහ නැවත චක්‍රලේඛයක් නිකුත් කිරීමට අවශ්‍ය නොවන බව අප සංගමයේ අදහසයි. එමෙන්ම තම ආයතනයේ ගෞරවය ආරක්ෂා කරමින් වෙනස් වන නූතන සන්නිවේදන හා මාධ්‍ය අවකාශය තුළ නිදහසේ අදහස් ප්‍රකාශ කළ හැකි වන පරිදි ආයතන සංග්‍රහයේ නියමිත වගන්ති පවත්නා සමාජ,ආර්ථික ,දේශපාලන හා තාක්ෂණික පරිසරයට ගැලපෙන පරිදි සංශෝධනයට ලක් කළ යුතු බව ද ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ ස්ථාවරය බවද අවධාරණය කරමු.

ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

පදුල ශ්‍රී රෝහණ ද සිල්වා
ගරු සභාපති

ප්‍රදීප් ලක්ශාන්ත
ගරු ලේකම්